ආයතනයේ නම : වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ඟිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගණු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர் : வனப் பாதுகாப்புத் திணைக்களம்

பாராளுமன்றத்தின் அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கை தொடர்பில் நிலையியற் கட்டளை 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளையும் எடுத்த நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Name of the institution: Department of Forest Conservation

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the committee on public Accounts in terms of Standing Order NO. 199(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 183

ආයතනයේ නම : වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

2020 මූල්‍ය වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය හා ප්‍රගති සමාලෝචන වාර්තාවෙන් ඉදිරිපත් කර ඇති දුර්වලතා	ඒ සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග / වර්තමාන තත්වය
පළමු කොටස :	
1. වාර්ෂික මූල්‍ය ප්‍රකාශය නියමිත දිනට ඉදිරිපත් කර නොතිබීම.	➢ නියමිත දිනට ඉදිරිපත් කර ඇත.(2021.02.28 දිනට)
2. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම නියමිත දිනට ඉදිරිපත් කර නොතිබීම.	➢ නියමිත දිනට ඉදිරිපත් කර ඇත. (2021.02.28.දිනට)
3. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුනි.	➢ බොහෝ විගණන විමසුම් කලාප කාර්යාල වලට, දිසාවන කාර්යාල වලට සහ විවිධ අංශ වලට අදාල ඒවා වන බැවින් තොරතුරු ගෙන්වා ගැනීමේ දී ඒ සඳහා කාලයක් ගතවේ. එමනිසා විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු සැපයීම ප්‍රයෝගිකව අපහසු කාර්යයකි. හැකි සෑම අවස්ථාවකම අවම කාලයක් තුල පිළිතුරු සැපයීමට කටයුතු කෙරේ.
4. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි.	➢ ගිණුම් ශාඛාවේ ඇති කාර්ය බහුලතාවය මත මසක් තුල පිළිතුරු දීමට අපහසු වූ අවස්ථා ඇත. බොහෝ විමසුම් සඳහා මාස දෙකක් තුල පිළිතුරු සපයා ඇත. එමෙන්ම , බොහෝ විගණන විමසුම් කලාප කාර්යාල වලට, දිසාවන කාර්යාල වලට සහ විවිධ අංශ වලට අදාල ඒවා වන බැවින් තොරතුරු ගෙන්වා ගැනීමේ දී ඒ සඳහා කාලයක් ගතවේ. එමනිසා විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු සැපයීම ප්‍රයෝගිකව අපහසු කාර්යයකි. හැකි සෑම අවස්ථාවකම අවම කාලයක් තුල පිළිතුරු සැපයීමට කටයුතු කෙරේ.
5. වහනයක් ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබිණි.	➢ 2022 වර්ෂයේ ගර්හිත වාහන අපහරණය කිරීම ආරම්භ කර ඇත.දැනට දිස්ත්‍රික්ක 19ක අපහරණ තක්සේරු කමිටු අවසන් කර ඇත.
6. රා.පරි.චක්‍රලේඛ 30/2016 අනුව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	➢ COVID 19 වසංගත රෝගයේ ව්‍යාප්තිය හා පැවති ඉන්ධන හිහය හේතු කොටගෙන ඉන්ධන දහන පරීක්ෂාව සිදු නොකළ අතර , 2023 වර්ෂයේ දැනට ඉන්දන දහන පරීක්ෂාව ආරම්භ කර ඇත.රජයේ ප්‍රතිපත්ති තීරණයක් අනුව සලාක ක්‍රමයට තෙල් ලබා දීම නිසා ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කිරීම තරමක් අපහසු ය.
7. නියමිත දිනට බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි.	➢ 2020 වර්ෂය සඳහා CIGAS වැඩසටහන යාවත්කාලීන කිරීමේදී ඇතිවූ ගැටළුවක් නිසා මුල් මාස කිහිපය ප්‍රමාද වූ අතර, අනතුරුව නියමිත දිනට ඉදිරිපත් කර ඇත.
8. සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට පැවත එමින් තිබූ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර නොතිබුණි.	➢ අක්‍රිය බැංකු ගිණුම් සියල්ල නිරවුල් කිරීමට අවශ්‍යය කටයුතු සිදුකෙරෙමින් පවතී.දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කළ ව්‍යාපෘතින් වලට අදාළව කලාප හා දිසාවන කාර්යාලයන්හි බැංකු ගිණුම් 25ක් ආරම්භ කර ඇති අතර ,අක්‍රිය ව පවතින්නේ එම බැංකු ගිණුම් අතුරින් කොටසකි.මේ වන විට ඒ සම්බන්ධයෙන් කලාප කාර්යාලවලින් තොරතුරු කැඳවා ඇති අතර , ලැබෙන තොරතුරු අනුව මාස 06ක කලායක් තුළ ගනු

	දෙනු සිදු නොවූ බැංකු ගිණුම් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව වසා දැමීමට කටයුතු කරමි.
9. බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	➢ බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් වලින් බොහොමයක් පසුව මුදල් රෙගුලාසි අනුව නිරවුල් කර ඇත. 2023 මුදල් වර්ෂයේ පෙබරවාරි මාසයේ බැංකු සැසඳුම් මහින් සියලුම ගැලපුම් සිදුකර අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.
10. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුනි.	➢ අදාළ හිඟ ණය ශේෂයන් අදාළ නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමටත් , නොඑසේනම් නීතිමය ක්‍රියාමාර්ග මහින් හෝ අයකර ගැනීමටත් කටයුතු කෙරෙමින් පවතී.එම කටයුතු කඩිනමින් සිදු කිරීම සඳහා කමිටුවක් පත්කර, එහි නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කෙරේ.
11. පොදු තැම්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැම්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබිනි.	➢ මු.රෙ.571 ප්‍රකාරව හඳුනාගත් ඉකුත් තැම්පතු රජයේ ආදායමටබැර කිරීමට කටයුතු කර ඇත.
12. සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	➢ 2020 වර්ෂය සඳහා වන කාර්ය සාධන වාර්තාවේ මූලික කෙටුම්පත නියමිත කාල සීමාව වන විට සකස්කර අවසන් කරනලද අතර , දෙමළ භාෂාපරිවර්තනය මුද්‍රණය හා සෝදුපත් පරීක්ෂාව ආදියට කිසියම් කාලයක් ගතවීම නිසා ප්‍රමාද විය .ඉදිරියේ දී මෙම තත්වය මහහරවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

දෙවන කොටස :

1. ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	➢ දෙපාර්තමේන්තුවට අදාළ සාමාන්‍ය තොරතුරු ,තාක්ෂණික තොරතුරු ,දත්ත,සිතියම්,පාරිසරික සංවාරක තොරතුරු ,ජෛව වවිධත්ව තොරතුරු, නීති තොරතුරු ආදිය මහජනතාවට දැනගැනීම/ලබාගැනීම සඳහා වෙබ් අඩවියක් 2018 වනර්ෂයේ දී නිර්මාණය කරන ලදී.නමුත් පසුකාලීනව පරිශීලකයන් අපේක්සා කළ පරිදි එය පරිශීලන හිත කාමී (User Friendly) නොමැති වීමත් නිසි නඩත්තු හා යාවත්කාලීන කිරීම් සිදු නොකිරීමත් , විවිධ තාක්ෂණික දෝෂ මතුවීමත් මත එහි ක්‍රියාත්මකභාවය දුර්වල විය.මෙවන විට වෙබ් අඩවිය පැවතිය ද ඉහත කරුණු හේතු කොටගෙන එහි ක්‍රියාකාරිත්වය අපේක්ෂා මට්ටමක නොමැත. එහෙත් වෙබ් අඩවියක් පවත්වාගෙන යාමේ දැඩි අවශ්‍යතාවය මත පසුගිය වර්ෂයේ දී (2022)වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා තාක්ෂණික කමිටුවක ඇගයීම මත විෂය නිර්ණය පත්‍රයක් (TOR) සකසා ප්‍රසම්පාදන කටයුතු ද ඉටුකරන ලදී.එහෙත් පසුගිය වසරේ 2වන කාර්තුවේ සිට රටේ සිදු වූ ආර්ථික කඩා වැටීම් නිසා රජයේ වියදම් පාලනය කිරීමේ අරමුණින් සිදුකරන ලද ප්‍රතිපාදන කප්පාදුව අනුව මේ සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන අපසු ලබා ගන්නා ලදී .ඒ හේතුවෙන් මෙම වෙබ් අඩවිය සැකසීමේ කටයුතු අතරමඟ දී අතහැර දැමීමට සිදු විය. මෙම වර්ෂයේ දීද මෙම කටයුතුත ඉටු කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලා සිටිය ද ඒ සඳහා ප්‍රතිපාදන ලබා දී නොමැත.එහෙත් මෙම කටයුත්ත අත්‍යාවශ්‍යයෙන්ම ඉටුකරගත

	යුතු නිසා ප්‍රතිපදන ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.ඒ අතරතුරු මෙම කටයුත්ත ඉටු කිරීම සඳහා සම්පූර්ණ කළ යුතු තාක්ෂණික කරුණු සම්පාදනය කිරීම ද , ප්‍රසම්පාදන කටයුතු ද ආරම්භ කර ඇත.
2. රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	➢ COVID 19 වසංගත රෝගයේ ව්‍යාප්තිය හේතුවෙන් කාර්යාල කටයුතු නිසි පරිදි සිදු නොවූ අතර , 2022 වර්ෂය සඳහා විධිමත් මානව සම්පත් සැලැස්මක් සකස් කර ඇත.
3. සකස් කළ මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් පැය 12 ක අවම පුහුණු වීමක් නියම කර නොතිබිණි.	➢ 2020 වර්ෂයේ දී ප්‍රධාන කාර්යාලයේ සහ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ තොරතුරු ලබාගෙන අවශ්‍යතාවය පරිදි පුහුණු සැලසුමක් සකස්කරන ලදී.මෙම සැලසුම COVID 19 වසංගත රෝගයේ ව්‍යාප්තිය හේතුවෙන් 2020 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.
4. සමස්ථ කාර්ය මණ්ඩලය ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම් ගතව නොතිබුණි.	➢ 2020 වර්ෂයේ දී රටෙහි පැවති තත්වය මත කාර්යාලීය කටයුතු සුපුරුදු පරිදි සිදු නොවීම නිසා කාර්ය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම් ගත වීමට නොහැකි විය. නමුත් මේ වනවිට 2023 වර්ෂය සඳහා කාර්ය සාධන ගිවිසුම් සකස්කර , ගිවිසුම්ගතව ඇත.
5. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	➢ 2020 වර්ෂයේ දී ප්‍රධාන කාර්යාලයේ සහ ක්ෂේත්‍ර නිලධාරීන්ගෙන් තොරතුරු ලබා ගෙන අවශ්‍යතාවය පරිදි පුහුණු සැලැස්මක් සකස් කරන ලදී .මෙම සැලසුම කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් 2020 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.
6. විගණකාධිපතිවරයා විසින් ජේද වලින් පෙන්වා දී තිබූ අඩු පාඩු / දෝෂ නිවැරදි කරවාගෙන නොතිබිණි.	➢ විගණකාධිපතිවරයා විසින් ජේද වලින් පෙන්වා දී තිබූ අඩු පාඩු / දෝෂ හැකිතාක් නිවැරදි කරවාගැනීමට කටයුතු කර ඇත.
7. හදුනාගත් පළමු කාර්ය සාධන දර්ශකයේ ළඟාවීම 50%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය.	➢ COVID 19 වසංගත රෝගයේ ව්‍යාප්තිය හේතුවෙන් කාර්යාල කටයුතු නිසි පරිදි සිදු නොවූ බැවින් , කාර්ය සාදන දර්ශකයන් වෙත ළඟාවීම අපේක්ෂිත මට්ටමට සිදු නොවීය.2023 වර්ෂයේදී අපේක්ෂිත කාර්ය සාධන දර්ශකයන් වෙත ළඟා වීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.
8. හදුනාගත් දෙවන කාර්ය සාධන දර්ශකයේ ළඟාවීම 50%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය.	➢ COVID 19 වසංගත රෝගයේ ව්‍යාප්තිය හේතුවෙන් කාර්යාල කටයුතු නිසි පරිදි සිදු නොවූ බැවින් , කාර්ය සාදන දර්ශකයන් වෙත ළඟාවීම අපේක්ෂිත මට්ටමට සිදු නොවීය.2023 වර්ෂයේදී අපේක්ෂිත කාර්ය සාධන දර්ශකයන් වෙත ළඟා වීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.
9.හදුනාගත් තුන්වන කාර්ය සාධන දර්ශකයේ ළඟාවීම 50%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය.	➢ COVID 19 වසංගත රෝගයේ ව්‍යාප්තිය හේතුවෙන් කාර්යාල කටයුතු නිසි පරිදි සිදු නොවූ බැවින් , කාර්ය සාදන දර්ශකයන් වෙත ළඟාවීම අපේක්ෂිත මට්ටමට සිදු නොවීය.2023 වර්ෂයේදී අපේක්ෂිත කාර්ය සාධන දර්ශකයන් වෙත ළඟා වීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

ටී.පී.හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ (මුදල්) (වැ.බ)
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

T.P. Hettiarachchi
Director (Finance) Acting
Department of Forest Conservation
Sampathpaya, Rajamalwatta.
Battaramulla.

කේ.එම්.ඒ.බණ්ඩාර
වන සංරක්ෂක ජනරාල්
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

ආචාර්ය කේ.එම්.ඒ. බණ්ඩාර
වන සංරක්ෂක ජනරාල්

ආර්.එම්.සී.එම්.හේරත්
ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ
අමාත්‍යාංශය.

ආර්.එම්.සී.එම්. හේරත්
ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ
අමාත්‍යාංශය